


ආයුර්වේදය දර්ශය බිහිවූයේ බුද්ධ කාලයට පෙර වර්ෂ 3500 - 4000 පමණ පෙරය. එය ඍෂි යුගයයි. එකල ඍෂිවරුනට අවබෝධ නොවූ දෙය අව්‍යක්ත නමින් හැඳින්වීය. ඒ අව්‍යක්ත කිසිවක් නොව නිබ්බාන බව මහාබ්‍රහ්ම අනුයාත පිරිස පසුව අවබෝද කළෝය.

සක්කාය දිට්ඨි, විචිකිච්චා සීලබ්බත පරාමාස ප්‍රහීනයෙන් සෝවාන් බවට පත්වේ. සකදාගාමී ඵලයට පත්වීමේදී කාමරාග පඨීඝප්‍රහීන වන්නේය. ඉන් අනතුරුව අනාගාමී නිබ්බාන සාක්සාත්කර ගනී අව්‍යක්තය ව්‍යක්ත බවට පත් කළෙත් බුදුන්වහන්සේමය. එහෙයින් සියලු දර්ශනයන්ට අග්‍ර වනුයේ බුද්ධ දර්ශනයයි. ආයුර්වේද දර්ශනය දෙවෙනි වනුයේ බුද්ධ දශීනයට පමණි.

අපවිසින් ප්‍රතිකාරකරනු ලබනපංච විංශති පුරුෂයාගේ ක්‍රියාකාරී ශරීර ස්වභාවය



# ප්‍රතිකාර කරන්නේ කවරහුට ද

ඔහු ප්‍රතිකාරය ලබාගන්නා තැනැත්තාය. ප්‍රතිකාරය යනු චිකිත්සාවට තවත් නමෙකි. වචන දෙකින්ම අරුත් ගැන්වෙනුයේ රෙ-ා්පාපනය සඳහා වනඋපක්‍රමයි. "චිකිත්සා-පුරුෂ" යන නාමයෙන් අපි ආත්මයෙන් ආත්මයට මාරුවෙමින් සසරේ සැරිසරන්නෝ වම්හ. නමුත් අප බලාපොරොත්තු වන්නේ එම දුක්ඛ අවස්ථාවෙන් ඉවත් වී නිවන කරා යාමටය. එහෙයින් අපි අනාත්මවාදී වමු. මිනිසා එක් ආත්මයකින් පසු මිනිස් ලොව උපත සඳහා සූදානම් වන අවස්ථා වස්ත්‍රී පුරුෂ සංසර්ගයෙන් පසු, ශුක්‍ර ශෝණිත එක්වීමේදී මෙම උපතේදී ආරම්භය ඇති කෙරේ. මේ අවස්ථාවේදී අප ගෙනඑන දෙයක් ඇත. මහාන් හෙවත් වහත් බවයි. (මහන්තත්වයයි) ඒ සමගම එය අහංකාරත්වය කරා - වර්ධනය වන්නේය. ඒ සමඟ මපංචතන්මාත්‍රා වර්ධනයවේ. මේ ඉතාම සියුම් අවස්ථාව ක්‍රමයෙන් වර්ධනය වී පංච භූත නිර්මාණය වන්නේය. ඒ සමඟම පංචේන්ද්‍රිය = (චක්ඛු, ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිත්වා, කාය) නිර්මාණය වන්නේය. ඒ සමඟම පංචේන්ද්‍රිය විෂයවන - පෙණීම, ඇසීම, ගඳ සුවඳ දැනීමරස දැනීම, ස්පර්ෂය = (වේදනා දැනීම) ක්‍රමක්‍රමයෙන් වර්ධනය වන අතර ගර්භයේ නවවන වසර සම්පූර්ණ කර, ලැබූ මිනිස් බව සම්පූර්ණකරමින් මෙළොව උපත ලබයි. මවු කිරෙන් පෝෂණය ලබා හිරු රැසින් ප්‍රසාරණයව සඳු රැසින් ද පෝෂණය ලබා වසරක කාලයකදී, අපිරිමිත උත්සාහයෙන් වසරක කාලයක් අවසන් වනවාත් සමඟම ඇවිදීමට සමත් වන්නේය. වසරින් වසර වැඩෙන මොහුට පසුගිය කාලයේ ගතකල දුක්බර ස්වභාව අමතක වන්නේය. අපි මෙය හොඳින් සොයන්නට සාක්සාත් කරගන්නට අවශ්‍ය වන්නේය. අපි මෙය හොඳින් දනිමු. අප මුලින් සඳහන් කල චිකිත්සා පුරුෂ පංච විංශනී පුරුෂ තත්වනමින් ද හඳුන්වා ඇත. එම කරුණු විසිහතර නම්

## අව්‍යක්ත

1 මහාන්
2 අහංකාර
5 පංචතන්මාත්‍රා (පංච භූතයින්ගේ ආරම්භයේ ඇති වන සියුම් අවස්ථා)
5 පංච භූත පඨවි, ආපෝ, තේජෝ, වායු ආකාශ
5 පංචන්ද්‍රිය (චක්‍ෂු, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිත්වා, කාය)
5පංචාරම්මන = (පංචන්දියවිෂය)
1 ආත්ම
1 මනස

25

මෙම සටහනෙහි අව්‍යක්ත නම් වචනයක්ද-ක්වා තිබේ. එනම් එය මහාබ්‍රහ්ම ඇතුළු මහර්ෂිවරු නොදන්නා දෙයකි. නොදන්නා



වෛද්‍යා
**ගාමිණී විජේසිංහ**
*රජයේ ආයුර්වේද මහ රෝහලේ*
*හිටපු ප්‍රධාන වෛද්‍ය නිළධාරී*
*ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී*
*බාහිර කථිකාචාර්ය -*
*ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍යායතනය,*
*කැළණිය විශ්ව විද්‍යාලය*

නිසා ව්‍යක්ත නොවන නිසා එය අව්‍යක්ත නමින් හැඳින්වීය. මෙම අව්‍යක්තය කිසිවක්නොව "නිබ්බාන" බව ඉගැන් වූ බුදුන්වහන්සේය.

සිද්ධාර්ථ කුමාරයෙක් සත්‍යය සොයා ගියේය. එම ගමනේදී ආලාරකාලාම තවුසා හමුවිය. ආලාරකාලාම විදසුන් වඩා ආකානඤ්චායතන නම් බ්‍රහ්ම ලෝකයට යාමට සමත් පූසාරීවරයෙකි. ඔහුගෙන් වැඩි ප්‍රතිඵලයක් නොලත් හෙයින් උද්දකරාමපුත්ත නම් ඍෂිවරයා වෙත ගියහ. ඔහුද විදසුන් වඩා විඥාඤ්චායතන නම බ්‍රහ්ම ලෝකයට යාමට සමත්වූවෙකි. සිද්ධාර්ථ කුමාරයෝ එයින්ද සෑහීමකට පත් නොවී තෙමේම නිවන සෙවීමෙහි මග සෙවීය. එය ආර්ය අෂ්ඨාංගික මාර්ගයම බව පසක් කළෝය. මේ බුද්ධ කාලයේදීය.

නිර්මාණය දෝෂ, ධාතු, මලවලින් ("දෝෂ ධාතු මල මූලං හි ශරීරම්") පුරුෂ ශරීරයෙහි රස, රක්ත, ස්වේද, ශ්ලේෂ්ම, පිත්ත, මල, මූත්‍රාදී) යම් ප්‍රමාණයක් වෙත් ද, සෝත්‍රස්හු ද එපමණ ප්‍රකාර විශේෂ (භේද) ඇත්තේය. පුරුෂ විෂයෙහි වූ සියලුම භාවයන්ගේ පැවතීම, ඉපදීම හෝ ක්‍ෂයට පැමිණීම ස්‍රොතස්‍රන්ගෙන් තොරව නොවන්නේමය. ස්‍රොතස් නම් පරිණාමයට පැමිණියා වූ ද, පැමිණෙන්නා වූ ද ධාතූන් වහනය කරණ මාර්ග වන්නාහුය. ධාතූන්ගේ ගමන ද, ස්‍රොතස් මාර්ගයන්ගෙන් ම වන්නේය. ස්‍රොත් අපරි සංඛ්‍ය වෙත්. ප්‍රකටව පවත්නා වූ ද, ස්ථුල ස්‍රොතස් මුල වශයෙන් සහ ප්‍රකෙම්ප විඥාන වශයෙන් දක්වමු. ප්‍රාණවහ ස්‍රොතස්, අන්නවහ ස්‍රොතස් ආදී වශයෙන් රස, රක්ත, මාංස, මේදය, අස්ථි, මජ්ජා, ශුක්‍ර, මූත්‍ර, පුරීෂ, ස්වේද වා, පිත්, සෙම්, වන මොවුන් වහනය කරනතර, සිදුරු සහිත, මාර්ගයන් වූ ස්‍රොතස් සහ මනස ආදීකොට ඇති අතීන්ද්‍රිය පදාර්ථයන් පදාර්ථයන් (නල රහිතව විකාශනය වන හො(ර්)මෝන) වහනය කරන්නා වූ ස්‍රොතස්හු ද වෙති.

ප්‍රාණ වහණය වන ස්‍රොතසුන්ගේ මූලය හෘදය සහ මහා ස්‍රොතසයි. දූෂිත වූ ස්‍රොතසුන්ගේ විශේෂ විඥානය සඳහා මෙම කරුණු දැනගත යුතුය. විශේෂයෙන් කිවහොත් විශේෂ හේතු පාසා ස්‍රොතස් දූෂණය නිසා වන ලක්‍ෂණ අනුව රෝග හඳුනා ගැනීමට පහසු වන්නේය.

## පුරුෂ මනෝභෙද

යොනි විශේෂයෙන් ශරීරය චතුර්විද වන්නේය. ජරායුජ, අණ්ඩජ, ස්වේදජ, උද්භිජ්ජ, යන විසිනි සාත්මික, රාජසික, තාමසික යන විසින් මනස ත්‍රිවිධයි. ඔවුන් අතුරෙන් සාත්වික මනස කල්‍යානාංශ හේතුවින් නිර්දේශ යයි ද, රෝෂාංග හේතුවින් රාජසිත මනස සදෝෂයයි ද, මෝහාංශ හේතුවින් තාමස මනස ද සදෝෂය යි උගන්වනු ලැබේ. සත්ව. රජස්, තමස් යන ගුණයන්ගේ තර, තම යෝගයෙන් සහ ශරීර වශයෙන් මෙන්ම යෝනි විශේෂයෙන් ද සාත්වික ආදී ත්‍රිවිධ මනස්හුගේ එක් එක් මනසෙජා ඇතිවන භේද ප්‍රමාණය අපරිසංඛ්‍ය වන්නේය. ශරීර සහ මනස එකවිට ඉපදීමත් ඔවුනොවුන්ගේ සමාන විධාන ස්වරූප නිසාය. එහෙයින් සාදාශ්‍ය අනුසාරයෙන් මනෝ භේද කීපයක් පහත දක්වන්නෙමු. සත්ව විශේෂයෙන් මනසෙහි ස්වභාවයන් අනුව, සාත්වික පුරුෂ, රාජසික පුරුෂ, තාමසික පුරුෂයයි බෙදේ.

## සත්ව විශේෂයෝ

පවිත්‍ර බව, සත්‍ය සෙවීම, ජිතාත්මය, කර්තව්‍ය හා අකර්තව්‍ය වෙන් කිරීමෙහි බුද්ධි ශීල බව, ඥාන, විඥාන, වචන, ප්‍රති වචන පිළිබඳ ශක්ති සම්පන්න බව, ස්මෘතිමත් බව පහ කරණ ලද කාම, ක්‍රෝධ, ලෝභ, මාන, මෝහ ඊර්ෂ්‍යා, හර්ෂ යන මේවා ඇති බව. සියලු භූතයන්හි සම බව, යන මේවා ඇති මනස බ්‍රාහ්ම-සත්ව නැමැති දත යුතුය. යාග කිරීම, අද්ධ්‍යනය, දාත, හෝම යන ප්‍රහ්ම චර්‍ය පරායණ පන අත්ථි ව්‍රත ඇති බව පහ කරණ ලද මද, මාන, අනුරාග, ද්වේශ, ලෝභ මෝහ සහ රෝෂ ඇති බව. ප්‍රතිභා - ඥාණ, විඥාන වචන ධාරණ ශක්ති යන මේ සියල්ල ඇති මනස ආර්ෂ සත්ව නැමැයි දත යුතුය. ධර්ම, අර්ථ, කාමයන්හි නිරත වූ පුරුෂයා මනස චේන්ද්‍ර සත්ව ........ දත යුතුය. කටයුතු හා නොකටයුතු ව්‍යවස්ථා කිරීමෙහි යෙදෙන පැමිණී කායයීන් සඬද්වය නොකරණ, මහා සාමර්ථය ඇති, ස්මෘතිමත් ඓශ්වර්යයෙහි එල්බෙන පහ කළ රංගාර්ක, ද්වේශ, මෝහ යන මේවා ඇත්තාහුගේ මනස සාම්‍ය - සත්ව නමැයි දැන ගන්නේය. ශූර වූ ධීර වූ, ශුචි වූ, අශූචිද්වේෂී වූ යාග කරන ජලවිහාරය ප්‍රිය කරන ක්ලිෂ්ට කරම් නොකරන සහ සුදුසු තන්හි කෝප වන්නා වූ ද - පහදින්නා වූ ද තැනැත්තා ගේ මනස වාරුණ සත්ව නැමැයි දැන ගත්තේය. සුදුසු තන්හි මානයත් උපභෝගයත් කරන්නාවූ, පරිවාර සම්පන්නා වූ සුඛ විහාරී වූ ධර්ම - අර්ථ - කාමපරායණ වූ ගැබ් වූ, ව්‍යක්ත, කෝපය හා පැහැදීම අති පුරුෂයා හෝ මනස කෞවේර සත්ව නැමැයි දැන ගන්නේය. නෘත්‍ය ගීත, විද්‍යුත් හා කදර්ථ ව්‍යාඛ්‍යානය උයද කෙරෙන, ශ්ලෝක, කථාවස්තු - ඉතිහාසය - පුරාණ යන මේවා දක්‍ෂ වූ සුවද මල්දම් - විලවුන් වස්ත්‍ර සහ ස්ත්‍රී විහාරයෙහි ඇළුනා වූ අනුන්ට නින්දා නොකරන පුරුෂයාගේ මනස ශක්තිධර්ම - සත්ව නමැති දැනගත්තේය. ශුභ කත්වයන්ගේ ගුණාංග ඇති හේතුවෙන් මෙකී පරිදි සාත්වික මනුස්හුගේ සප්ත විධ භේදයන් දැනගත යුතුය. සත්ව ගුණාංගයන්ගෙ ආධික්‍යයයන් බ්‍රාහ්ම්‍ය සතවය අතිශයින් ශුද්ධය යි දැන ගත්තේය. මෙසේ මනසේ යථා තත්වය අනුව සාත්වික පුරුෂ පුද්ගල හෘදයන් සවිස්තර කරන ලදී.

**ඉදිරි ලිපිය බොහෝ රෝග ඇතිවන්නේ ආහාර දෝශ නිසාය - බලාපොරාත්තු වන්න.**